# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

**අති විශේෂ**

**අංක 2460/12 - 2025 ඔක්තෝබර් මස 29 වැනි බදාදා - 2025.10.29**

**(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)**


## I වැනි කොටස: (I) වැනි ඡේදය - සාමාන්‍ය

### රජයේ නිවේදන

**1974 අංක 02 දරන ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩල පනත**

92 වැනි වගන්තිය යටතේ නියමය

1974 අංක 02 දරන ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩල පනතේ, 92 වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, නාගරික සංවර්ධන, ඉදිකිරීම් සහ නිවාස අමාත්‍ය, අනුර කරුණාතිලක වන මම, එකී මණ්ඩලයට, හන්තානවත්ත ජල සම්පාදන ව්‍යාපෘතියේ, 80 $m^3$ ජල ගබඩා ටැංකිය හා ප්‍රවේශ මාර්ගය ඉදි කිරීම සඳහා ඉඩම් කොටස් අවශ්‍යව ඇති හෙයින්, මෙහි පහත උපලේඛනයෙහි දැක්වෙන ඉඩම් කොටසෙහි නිශ්චල දේපළ අයිතිය අත් කර ගැනීම මෙම නියමයෙන් අනුමත කරමි.

**අනුර කරුණාතිලක,**
නාගරික සංවර්ධන, ඉදිකිරීම් සහ නිවාස අමාත්‍ය.

යොමු අංකය : MUDH/WS/LA/02/560.
2025 ඔක්තෝබර් මස 08 වැනි දින,
නාගරික සංවර්ධන, ඉදිකිරීම් සහ නිවාස අමාත්‍යාංශය,
12 වන මහල, සෙත්සිරිපාය අදියර 11,
බත්තරමුල්ල.

**උපලේඛනය**

මධ්‍යම පළාතේ, මහනුවර දිස්ත්‍රික්කයේ, මහනුවර කඩවත්සතර සහ ගඟවට කෝරළේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, අංක 242, හීරැස්සගල ග්‍රාම නිලධාරී කොට්ඨාසයේ, හීරැස්සගල ගමේ පිහිටි, පහත සඳහන් මායිම් තුළ පිහිටි පර්චස් 10 ක් පමණ වන ඉඩම් කොටස:

**මායිම් :**

| | | |
|---|---|---|
| *උතුරට* | : | මෙම ඉඩමේ ඉතිරි කොටස |
| *නැගෙනහිරට* | : | මෙම ඉඩමේ ඉතිරි කොටස |
| *දකුණට* | : | මෙම ඉඩමේ ඉතිරි කොටස |
| *බටහිරට* | : | බොරළු පාර සහ මෙම ඉඩමේ ඉතිරි කොටස |

*ඉඩමට හිමිකම් කියන්නාගේ නම සහ ලිපිනය*

1. සාමාන්‍යාධිකාරී,
ජනතා වතු සංවර්ධන මණ්ඩලය,
අංක 15/75,
වොක්ෂෝල් වීදිය,
කොළඹ 02.

EOG 10 - 0259